SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# අදියර I - විභාගය - 2020 ජූලි

# යෝජිත උත්තර

## විෂය අංක (103)

## 103 ආර්ථික විද්‍යාව (ECN)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන: 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

අදියර I විභාගය - 2020 ජූලි

# (103) ආර්ථික විද්‍යාව

## යෝජිත උත්තර

(මුළු ලකුණු 40)

**A කොටස**

### 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː

**1.1** (4)

**1.2** (3)

**1.3** (3)

**1.4** (2)

**1.5** (3)

**1.6** (2)

**1.7** (1)

**1.8** (4)

**1.9** (2)

**1.10** (1)

**1.11** සාමාන්‍ය පිරිවැය

**1.12** වැඩි

**1.13** අසත්‍යය

**1.14** සත්‍යය

**1.15** අසත්‍යය

**1.16**
1. කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
2. කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
3. කා සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

**1.17** කෙටි කාලය තුළ නිරත වන නිෂ්පාදන ආයතන විසින් විචල්‍ය යෙදවුම් සහ ස්ථාවර යෙදවුම් යන දෙවර්ගයම භාවිතා කරන අතර ස්ථාවර සාධක නොවෙනස්ව තබා ගනිමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරමින් නිෂ්පාදනයේ නිරත වේ. එහිදී නිමවුම කිසියම් රටාවකට අනුව හැසිරෙන අතර එම හැසිරීම 'හීනවන ආන්තික ඵලදා නීතිය' මගින් පෙන්නුම් කෙරේ.

නිෂ්පාදන ආයතන විසින් කෙටි කාලයේ දී ස්ථාවර යෙදවුම් සමග මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරන විට විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව හා සාමාන්‍ය ඵලදාව එක්තරා අවස්ථාවකට පසුව පහළ යෑම හීනවන ආන්තික ඵලදා නීතිය නම් වේ.

ආන්තික ප්‍රතිලාභ අඩුවීමේ නීතියට අනුව, ඕනෑම නිෂ්පාදන ක්‍රියාවලියක දී අනෙක් සාධක ස්ථාවර ව තිබියදී තවත් එක් විචල්‍ය යෙදවුම්ඒකකයක් වැඩි කිරීම, සමස්ත නිමවුම අඩුවීමට හේතු වේ.

**1.18** 1. වෙළඳපොලේ තනි විකුණුම්කරුවෙකු සිටී.
**2.** නිෂ්පාදනය සුවිශේෂ වීම (සමීප ආදේශක නැත.)
**3.** එක් ආයතනයක් පමණක් නිෂ්පාදනයේ නිරත වීම
**4.** වෙළඳපල මිල තීරණය කළ හැකි බැවින් මිල සාදන්නෙකි.
**5.** මිල වෙනස් කිරීම දැකිය හැකිය.
**6.** ප්‍රවේශයට බාධා පැවතීම
**7.** ලාභ උපරිම කරන්නකු ලෙස
**8.** වෙළෙඳපොළ තොරතුරු අසම්පූර්ණ වීම හා පිරිවැයකින් තොරව ලබා ගත නොහැකි වීම.

**1.19** 1. නොවිධිමත් ආර්ථිකය තුළ සිදුවන ඵලදායී නිෂ්පාදන ඇතුළත් නොවීම
2. යැපුම් ආර්ථික කටයුතු ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම
3. ගෘහණියන්ගේ සේවය ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම
4. රාජ්‍ය ණය පොළී ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමට දායක කර නොගැනීම
5. නිෂ්පාදනය නිසා පරිසරයට සිදුවන හානිය සැලකිල්ලට නොගැනීම
6. රාජ්‍ය සේවාවල ඵලදායීතාවේ ඇති වන වෙනස් වීම සලකා නොලැබීම
7. යුද හා ආරක්ෂණ කටයුතු සඳහා දරන වියදම් ඵලදායි නිෂ්පාදනයක් ලෙස සැලකීම
8. කල් පවත්නා ඇතැම් පාරිභෝගික භාණ්ඩ ආයෝජනයක් ලෙස සලකා ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොකිරීම.

**1.20** 1. මිල ස්ථායිතාවය
2. පූර්ණ සේවා නියුක්තිය
3. ගෙවුම් ශේෂ සමතුලිතතාවය
4. ආදායම් බෙදායාමේ සාධාරණත්වය
5. තිරසාර සංවර්ධනය
6. ආර්ථික වර්ධනය

(එකකට 02බැගින් මුළු ලකුණු 40)

**A කොටසෙහි අවසානය**

(මුළු ලකුණු 40)

**B කොටස**

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

පරිච්ඡේදය 01 -ව්‍යාපාර පරිසරයට අදාළ ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති

**(a)** **ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ**

**ආර්ථික භාණ්ඩ**

ආර්ථික භාණ්ඩ යනු සැපයුමෙහි හිඟකමක් දක්නට ලැබෙන නිෂ්පාදනයේ දී හෝ පාරිභෝජනයේ දී ආවස්ථික පිරිවැයක් වැය වන භාණ්ඩ හා සේවාවන් ය. එනම්, මෙකී භාණ්ඩ හිඟ සම්පත් භාවිත කොට, සාධක සංයෝග කිරීම තුළින් සමාජයේ කුමන හෝ පාර්ශ්වයක් විසින් නිපදවා ඇත.

උදා- ආහාර, ඇඳුම්, වාහන, අධ්‍යාපන සේවා ආදිය

ආර්ථික නොවන භාණ්ඩයක් යනු සැපයුමක් පවතින විට ශුන්‍ය මිලක දී අසීමිතව පාරිභෝජනයකළ හැකි භාණ්ඩ වේ. මෙකී භාණ්ඩ සම්බන්ධයෙන් මිනිසාගේ මැදිහත් වීමක් නොපවතින නිසා නිෂ්පාදනයේ දී හෝ පාරිභෝජනයේ දී සම්පත් පිරිවැයක් හෝ ආවස්ථික පිරිවැයක් හෝ නොපවතී.

උදා- වාතය, ජලය සහ ස්වභාවික පරිසරය

***(ලකුණු 03)***

**(b)** **<u>සැලසුම්ගත ආර්ථිකයක මූලික ලක්ෂණ</u>**

1. සැලසුම්ගත යාන්ත්‍රණය මත පදනම්ව මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම
2. දේපළ හිමිකාරිත්වය රාජ්‍ය අංශය සතු වීම
3. රාජ්‍ය ව්‍යවසායක ක්‍රමයක් ක්‍රියාත්මක වීම
4. සාමාජ සුභසාධනය පිණිස කටයුතු කිරීම
5. පාරිභෝගික ස්වාධිපත්‍යක් නොමැති වීම
6. සාධාරණ ආදායම් ව්‍යාප්තියක් පැවතීම
7. තේරීමේ නිදහස නොමැති වීම
8. නිෂ්පාදන පරමාධිපත්‍යක් නොමැත.
9. අඩු රැකියා මට්ටම.

***(ලකුණු 04)***

(c) **<u>ආර්ථික විද්‍යාවේ ආවස්ථික පිරිවැය සංකල්පය</u>**

සම්පත් හිඟ නිසාත්, ඒවායේ විකල්ප ප්‍රයෝජන පවතින නිසාත් විකල්ප අතුරින් එක් විකල්ප අවස්ථාවක් තෝරා ගැනීම නිසා කැප කිරීමට සිදු වන ඊළඟ හොඳම විකල්ප අවස්ථාවේ වටිනාකම ආවස්ථික පිරිවැයයි.

ආවස්ථික පිරිවැය යනු සැබෑ සංකල්පයක් වන අතර එය තීරණ ගැනීමේදී මූල්‍ය වටිනාකම ඇතුළත් වීමේ හෝ නොවීමේ හැකියාවක් ඇත. ආර්ථික විද්‍යාවේ තීරණ ගැනීමේදී සලකා බලනු ලබන ප්‍රධාන පිරිවැය එයයි.

**උදාහරණ:** යම් පුද්ගලයෙක් තම ශ්‍රමය, ප්‍රාග්ධනය සහ වෙනත් වත්කම් උපයෝගී කර ගනිමින් ව්‍යාපාරයක් ආරම්භ කර ඇත්නම්, මෙම ව්‍යාපාරයේ ආවස්ථික පිරිවැය වන්නේ, ඔහුගේ ශ්‍රමයෙන් උපයා ගත හැකි ප්‍රතිලාභ, ආදායම් හෝ ප්‍රතිලාභ, ආයෝජනය කළ ප්‍රාග්ධනය සහ වෙනත් වත්කම් වෙනත් තැනක භාවිතා කිරීමේ අවස්ථාවන්ය.

***(ලකුණු 03)***
***(මුළුලකුණු 10)***

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| පරිච්ඡේදය 02- ඉල්ලුම, සැපයුම, සමතුලිතය හා රජය මැදිහත් වන ආකාරය |
|---|

**(a) (i)** Qd = 180 - 4p

Qs = -20 + 6p

**සමතුලිතයේදී; Qd=Qs**

180- 4p = -20 + 6p

200 = 10p

200/10 = p

**20 = P**

සමතුලිත මිල - රු**. 20/-**

**P=20 සමීකරණයට ආදේශ කළ විට,**

Qd = 180 - 4p

Qd = 180 - (4 x 20)

Qd = 180 - 80

**Qd = 100**

සමතුලිත ප්‍රමාණය - ඒකක **100**

***(ලකුණු 03)***

**(ii)**




පාරිභෝගික අතිරික්තය = $\frac{\text{(උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල)}}{2}$ X සමතුලිත ප්‍රමාණය

= $\frac{(45-20) \times 100}{2}$

= රු**. 1,250/-**

***(ලකුණු 02)***

**(b)** **මිල ඉල්ලුම් නම්‍යතා තීරක පහත පරිදි දැක්විය හැකිය**

- භාණ්ඩයකට ඇති ආදේශක සංඛ්‍යාව හා ඒවායේ සමීප බව
- පාරිභෝගික අයවැයේ කොටස (නිෂ්පාදනය සඳහා වෙන් කර ඇති ආදායමේ ප්‍රතිශතය)
- මිල වෙනස් විමට අනුගතවිමටගතවනකාල පරිච්ඡේදය
- භාණ්ඩ සැදීමේ පුරුද්ද
- සලකා බලන භාණ්ඩයක සුඛෝපභෝගි බව හෝ අත්‍යවශ්‍ය බව
- ලබා දී ඇති කාල පරිච්ඡේදයේ විකල්ප භාවිත ගණන

***(ලකුණු 02)***

**(c)** **වෙළෙඳපොළ තුළ රජය මැදිහත් වන ආකාරයන්කිහිපයකි.**

1. **බදු පැනවීම**

   වෙළඳපොළතුළට රජය මැදිහත්වී සිදු කරනු ලබන කාර්යයන්ගෙන් ප්‍රධාන කොට සැලකෙනුයේ පාරිභෝගියන්ගෙන් සහ නිෂ්පාදකයන්ගෙන් බදු අය කර ගැනීමයි. ඒ අනුව පරිභෝජනය කරනු ලබන ඒකකයක් මත නිශ්චිත රුපියල් ප්‍රමාණයක් හෝ භාණ්ඩයේ වටිනාකම මත කිසියම් ප්‍රතිශතයක් ලෙස බදු අය කර ගැනීම සිදු කෙරේ.

2. **සහනාධාර ලබාදීම**

   වෙළඳපොළතුළට රජය මැදිහත් වන තවත් ආකාරයක් ලෙස නිෂ්පාදකයන්ට හා පාරිභෝගිකයන්ට සහනාධාර ලබා දීම දැක්විය හැකිය. නිෂ්පාදකයින් විසින් දරනු ලබන පිරිවැය අවම කොට ඔවුන් දිරිමත් කිරීම සහානාධාරයක් ලෙස සැළකේ.

3. **මිල පාලනය**

   වෙළෙඳපොලේ ඉල්ලුම් සැපයුම් බලවේග මත තීරණය වී ඇති සමතුලිත මිල නිෂ්පාදකයාට හෝ පාරිභෝගිකයාට අසාධාරණ යැයි රජයට හැඟී යන විට රජය විසින් වෙළෙඳපොල බලවේග මගින් තීරණය වූ සමතුලිත මිල ගණන් වෙනස් කරනු ලැබේ. මෙය මිල පාලනය ලෙස හැඳින්වේ.

4. **රජයේ ව්‍යවසායයන්**

   රජයේ ව්‍යවසාය යනු රජය වෙනුවෙන් වාණිජ හෝ ව්‍යාපාරික කටයුතු සිදු කිරීම සඳහා රජයක් විසින් නිර්මාණය කරන ලද නීතිමය ආයතනයකි. අහිතකර වෙළඳපල තත්ත්වයන් වළක්වා ගැනීමට රජයේ ව්‍යවසායන් උපකාරී වේ.

5. **පොදු භාණ්ඩ සැපයීම**

   වෙළඳපොල ඇතැම් භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් වූ විට, අහිතකර ආර්ථික තත්ත්වයන් තුරන් කිරීම සඳහා රජය වෙළඳපොළට මැදිහත් වීමේ පැහැදිලි අවශ්‍යතාවයක් පවතී. එබැවින් රජය එම භාණ්ඩ සපයයි.

***(ලකුණු 03)***
***(මුළු ලකුණු 10)***

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**(a)**

| පරිච්ඡේදය 05-- මූල්‍ය පද්ධතිය, මුදල් සහ සාමාන්‍ය මිල මට්ටම |
|---|

**(i)** **මුදලේ ලක්ෂණ**

- පොදු පිළිගැනීම- මුදල් සැදී ඇති ද්‍රව්‍යය කිසිදු පැකිලීමකින් තොරව සැමට පිළිගත හැකි විය යුතුය.
- මුදල් පහසුවෙන් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගෙන යා හැකි වීම.
- කල්පැවතීම - මුදල් ද්‍රව්‍ය එහි වටිනාකම අහිමි නොවී දීර්ඝ කාලයක් පැවතිය යුතුය.

- කුඩා කොටස් වලට බෙදිය හැකි වීම - වෙළඳ භාණ්ඩවල කුඩා ඒකක මිලදී ගැනීමට ඉඩ දීම සඳහා මුදල් පහසුවෙන් බෙදිය හැකි විය යුතුය.
- සමජාතීය වීම - එහි ඒකක සමාන විය යුතුය.
- හඳුනා ගැනීමට පහසුව. - මුදල් පහසුවෙන් හඳුනාගත හැකි විය යුතුය.
- සාපේක්ෂ හිඟය.
- මුදලේ වටිනාකම ස්ථාවරව පැවතිය යුතු අතර දීර්ඝ කාලයක් තිස්සේ වෙනස් නොවිය යුතුය.: (වටිනාකම වෙනස් නොවී පැවතිම)
- අභ්‍යන්තර අගය මුහුණත වටිනාකමට වඩා වැඩි නොවිය යුතුය.
- අනුකරණය අපහසු වීම

***(ලකුණු 02)***

**(ii) විද්‍යුත් මුදල් භාවිත කිරීමට හේතු**

**විද්‍යුත් මුදල් භාවිත කිරීමට විවිධ හේතු තිබේ**

- පහසුවෙන් හා ඉක්මනින් සහ හැම තැනක, ඕනෑම වේලාවක ගෙවීම් පාරිභෝගිකයින් ආකර්ෂණය කරගැනීමට හැකි වීම
- ඕනෑම මුදලක් මාරු කළ හැකිය.
- ගෙවීම් පියවීම් ඉක්මන්වීම හා කාලය ඉතිරි වීම
- ජාත්‍යන්තර ගනුදෙනු සිදු කළ හැකිවීම
- මුදල් භාවිතා කරනවාට වඩා ආරක්ෂාව සහ සුරක්ෂිත ගෙවීම් ක්‍රමයකි
- සෑම ගනුදෙනුවක්ම සටහන් වේ.
- පාරිභෝගිකයාගේ පහසුව.
- බැංකුවල අභ්‍යන්තර ජාල සඳහා සම්බන්ධ විය හැකි වීම
- වාණිජ්‍ය ආයතන අතර පවත්නා තරගකාරිත්වය
- මූල්‍ය අංශයේ සංවර්ධනය.

**(ලකුණු 02)**

**(b)** මහ බැංකුවේ කාර්යයන් පහත දැක්වෙන පරිදි විවිධ කාණ්ඩ යටතේ සඳහන් කළ හැකිය.

**මූලික කාර්යයන්**

- ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වාගෙන යාම
- මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම

**වෙනත් කාර්යයන්**

- ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා කළමනාකරණය
- සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය
- නිල විදේශ සංචිත කළමණාකරණය
- රාජ්‍ය ණය කළමනාකරණය
- ප්‍රාදේශීය සංවර්ධනය
- වාණිජ බැංකු සමඟ සම්බන්ධතාව සහ වාණිජ බැංකු පාලනය කිරීම (බැංකු බැංකුකරු)
- ක්ෂුද්‍ර මූල්‍ය හා ප්‍රාදේශීය සංවර්ධනය
- මූල්‍ය බුද්ධිය
- ආර්ථික හා මිල ස්ථායිතාව
- මුදල් ප්‍රතිපත්තිය කළමනාකරණය කිරීම

- නිල විදේශ සංචිත කළමනාකරණය
- මුදල් නිකුත් කිරීම කළමනාකරණය කිරීම

(ලකුණු 02)

(c)

1. **ගනුදෙනු චේතනාව**

පුද්ගලයෙකු විසින් කරනු ලබන වියදමත් ඔහුට ලැබෙන ආදායමත් එකිනෙකට නොගැළපීම නිසා එදිනෙදා සිදුවන ගනුදෙනු සුමටව ඉටු කර ගැනීම සඳහා මුදල් ළඟ තබා ගැනීම ගනුදෙනු චේතනාව නිසා ඇති වන මුදල් ඉල්ලුම ලෙස හැඳින්වේ. ගනුදෙනු චේතනාව මත මුදල් ඉල්ලුම තීරණය වන්නේ පුද්ගල ආදායම මතයි. ගනුදෙනු චේතනාවෙන් මුදලට කරන ඉල්ලුමත් ආදායමත් අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී. එනම් ආදායම ඉහළ යන විට ගනුදෙනු චේතනාව මත මුදල් ඉල්ලුම ඉහළ යන අතර, අදායම පහළ යන විට ගනුදෙනු චේතනාව මත මුදල් ඉල්ලුම පහළ යයි.

2. **ආරක්ෂණ චේතනාව**

හදිසි අනතුරු, ලෙඩ රෝග වැනි අනපේක්ෂිත අවස්ථාවන්ට මුහුණ දීම උදෙසා පුද්ගලයන් විසින් මුදල් ශේෂ ළඟ තබා ගැනීම ආරක්ෂණ චේතනාව මත මුදලට ඇති ඉල්ලුම ලෙස අදහස් කෙරේ. ආරක්ෂණ චේතනාව නිසා මුදලට ඇති ඉල්ලුමත් ආදායමත් අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී.

3. **සමපේක්ෂණ චේතනාව**

පිළිණපත් වල මුදල් ආයෝජනය කිරීම තුළින් අනාගත ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් මුදල් ශේෂ ළඟ තබා ගැනීම සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම ලෙස අදහස් කෙරේ. එසේ නැතහොත් වත්කමක් ලෙස මුදල් ශේෂ ළඟ තබා ගැනීම සමපේක්ෂණ චේතනාව ලෙස හැඳින්වේ.

පුද්ගලයන් විසින් විවිධ වත්කම් තමන් ළඟ තබා ගැනීමට පෙළඹෙන අතර මුදල් හා පිළිණපත් අතර තේරීම් කිරීම පොළී අනුපාතකය අනුව සිදු වේ. මේ අනුව පොළී අනුපාතිකය සහ සමපේක්ෂණ චේතනාව මත මුදලට ඇති ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතී. එනම් පොළී අනුපාතය ඉහළ නම් සමපේක්ෂණ චේතනාව මත මුදල් ඉල්ලුම පහළ යන අතර පොළී අනුපාතිකය පහළනම් සමපේක්ෂණ චේතනාව මත මුදල් ඉල්ලුම ඉහළ යයි.

*(ලකුණු 04)*

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

| පරිච්ඡේදය 03 - නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම හා විවිධ වෙළඳපොළ ව්‍යුහයන් |
|---|

**(a)**




නිමවුම් මට්ටම උපරිම වන ස්ථානය **Q**1 වන අතර එහිදී **MC = MR** වේ.

පූර්ණ තරඟකාරී ආයතන එහි ආන්තික පිරිවැය ආන්තික ආදායමට සමාන වන අවස්ථාවේදී සමතුලිතතාවය ළඟා කර ගනී.

එබැවින්, එහි ආන්තික පිරිවැය ආන්තික ආදායමට සමාන වන ස්ථානයේ නිපදවයි.එම නිසා, සමාගම් ආන්තික පිරිවැය ආන්තික ආදායමට සමාන වන ස්ථානයේ නිපදවන නිමැවුම සමාගම්වල ප්‍රශස්ථ නිමැවුම වන අතර මෙම නිමවුම් මට්ටම සමාගමේ ලාභය උපරිම කරන නිමවුම් මට්ටමයි.

**(ලකුණු 04)**

**(b) COVID-19 හි ප්‍රතිවිපාක**

**1 සෘජු හා මූල්‍ය (කළඹ) ආයෝජන විදේශ ආයෝජන ඉවත් කිරීම**

මෙමගින් ගෙවුම් ශේෂ හිඟය ඉහළ යනු ඇති අතර පරතරය පිරවීම සඳහා රජයට වැඩි ණය ප්‍රමාණයක් ගැනීමට සිදුවනු ඇති අතර එමගින් රටේ ණය ගැනීම් වැඩි වේ.

**2 රටේ සංචාරක කර්මාන්තයේ පසුබෑම**

ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තයෙන් විශාල ආදායමක් උපයන අතර COVID-19 හේතුවෙන් එය දැඩි ලෙස බලපායි. කර්මාන්තයේ සේවකයින්ට රැකියා අහිමි වී ඇත.

**3 රටේ ආර්ථික සම්පත් විරැකියාව සහ ඌණ උපයෝජනය**

වසාදැමීම සහ COVID-19 වැළැක්වීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජාතික නිමැවුම හෝ ආදායම සැලකිය යුතු ලෙස අඩුවී ඇති අතර එය රැකියාවට සෘජුවම බලපායි. ස්වයං රැකියාලාභීන්ට රැකියා අහිමිවීමේ අවදානමක් ඇත.

**4 තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ ව්‍යාප්තිය**

ගෘහ සංකල්පයේ වැඩ කටයුතු තොරතුරු තාක්ෂණ උපකරණ සහ අන්තර්ජාල පහසුකම් භාවිතය වැඩි කළේය.

**5 ආර්ථිකයේ ව්‍යාපාරික ආදායම පහත වැටීම**

වසාදැමීම හේතුවෙන් රටේ ඇතැම් ව්‍යාපාර බංකොලොත් විය. වෛරසය පැතිරීම නැවැත්වීම සඳහා අපනයන බාධක පනවා ඇති හෙයින්, එම ක්‍රියාකාරකම්වල යෙදී සිටින ව්‍යාපාරවලට ආදායම් උත්පාදනය නොමැති නිසා ඔවුන්ගේ ව්‍යාපාර වසා දැමීමට සිදුවිය.

**6 නව අවස්ථා නිර්මාණය විය**

COVID-19 හේතුවෙන් මිනිසුන් නව ආකාරවලින් සිතීමට පටන් ගත් දා සිට නව සොයාගැනීම් හා ව්‍යවසායකයින් වර්ධනය විය.

තවත් ප්‍රතිවිපාක පහත පරිදි වේ.

- කොටස් වෙළඳපොලේ පහත වැටීම
- ජනතාවගේ ආදායම හා ජීවන තත්ත්වය අඩුවීම.
- රටේ ආර්ථික තත්ත්වය පිළිබඳව මහජනතාවගේ විශ්වාසය අඩුවීම.
- වෙනත් ආර්ථික හා සමාජ ගැටලු

***(ලකුණු 06)***
***(මුළුලකුණු 10)***

**B කොටසෙහි අවසානය**

(මුළු ලකුණු 20)

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 06 -අන්තර්ජාතික වෙළඳාම සහ විදේශ විනිමය වෙළෙඳපොළ**

**(A) (a)** **අන්තර්ජාතික වෙළෙඳාමේ වාසි**

- සාපේක්ෂ වාසි පදනම් කරගනිමින් අන්තර්ජාතික වෙළඳාමට සහභාගී වීම හේතු කොට වෙළෙඳාමට සහභාගීවන සෑම රටකටම තමන් සතු සීමිත සම්පත් උපරිම කාර්යක්ෂමතාවෙන් පරිහරණය කිරීමට අවස්ථාව සැලසේ. නිෂ්පාදන හැකියා වක්‍රයෙන් පිටත ලක්‍ෂ්‍යකට අදාළ නිමැවුම් මට්ටමක් පරිභෝජනය කිරීමට ශක්‍යතාව ලැබේ.
- සම්පත් උපරිම ලෙස භාවිතා කිරීමඃ ජාත්‍යන්තර වෙළඳාම රටකට තම සම්පත් උපරිම සීමාවට යොදා ගැනීමට උපකාරී වේ.යම් රටක් ආනයන හා අපනයන භාර නොගන්නේ නම් එහි සමහර සම්පත් ප්‍රයෝජනයට නොගනු ඇත.මේ අනුව සම්පත් නාස්තිය තුරන් කිරීමට එය උපකාරී වේ.
- පාරිභෝගිකයන්ට ලැබෙන ප්‍රතිලාභඃ ජාත්‍යන්තර වෙළඳාම තුළින් උසස් තත්ත්වයේ භාණ්ඩ හා සේවා භාවිතා කිරීමෙන් පාරිභෝගිකයින්ට ප්‍රතිලාභ ලැබේ.
- විදේශ වෙළෙඳාම මගින් වැඩි දියුණු වන ජාත්‍යන්තර සම්බන්ධතා
- නිෂ්පාදනයේ වැඩි වීම
- වෙළඳ උච්චාවචනයන් අඩු කිරීමට හැකි වීම
- අතිරික්ත නිෂ්පාදනය උපයෝගී කර ගැනීම
- ජාත්‍යන්තර සබඳතා ප්‍රවර්ධනය කිරීම
- වැඩි රැකියා අවස්ථා නිර්මාණය වනු ඇත
- සම්පත් හා තාක්‍ෂණික දැනුමෙන් දුර්වල රටවලට වුවද, නව තාක්‍ෂණික දැනුම මෙන්ම නිපැයුම් පරිහරණයට ද අවස්ථාව සැලසේ.
- අන්තර්ජාතික වෙළඳාම තුළින් රටවල් අතර දේශපාලනික, සංස්කෘතික හා සමාජීයසම්බන්ධතාවන් ගොඩනගා ගැනීමට හා ශක්තිමත් කර ගැනීමට අවකාශ සැලසේ.
- අන්තර්ජාතික වෙළඳාම නිසා තම රට තුළ නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් නොමැති ඕනෑම භාණ්ඩයක් හෝ සේවාවක් හෝ පරිහරණය කිරීමට ඕනෑම රටකට හැකියාව ලැබේ.

***(ලකුණු 04)***

**(b)** ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය යනු ආර්ථිකයක මූල්‍ය අධිකාරිය විසින් එක් විදේශ මුදල් ඒකකයක් සමග හුවමාරු වන දේශීය මුදල් ප්‍රමාණය තීරණය කිරීමයි. මෙම ක්‍රමය යටතේ රටක් කලින් තීරණය කළ පරිදි කාල සීමාව සඳහා නියත අනුපාතයක් තබා ගනී.

පාවෙන විනිමය අනුපාත ක්‍රමය යනු ආර්ථිකයක මූල්‍ය අධිකාරියේ මැදිහත්වීමකින් තොරව විදේශ මුදල් ඉල්ලුමේ අන්තර්ක්‍රියාකාරිත්වය සහ විදේශ මුදල් වෙළඳපොලේ විදේශ මුදල් සැපයීම මගින් තීරණය වන විනිමය අනුපාතයයි.

***(ලකුණු 03)***

**(B)** <u>ජාතික ගිණුම් සැකසීමේ වැදගත්කම</u>

- ආර්ථිකයේ කාර්ය සාධනය ඇගයිය හැකි වීම
- ජාත්‍යන්තර සැසඳීම් සඳහා උපකාරී වීම
- ආර්ථික වෘද්ධිය මැනිය හැකි වීම
- ආර්ථිකයේ ව්‍යුහමය ලක්ෂණ අනාවරණය කළ හැකි වීම
- ඒක පුද්ගල ජාතික නිෂ්පාදිතය ඇස්තමේන්තු කළ හැකි වීම
- සම්පත් සංයුතිය හා උපයෝජනය අනාවරණය වීම
- සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පුරෝකථනය කිරීම
- ආර්ථික කාරක අතර ශ්‍රිතාත්මක සම්බන්ධතා හඳුනා ගැනීම

***(ලකුණු 03)***

**(C.) (a) වෙළෙඳපොළමිලට දළ දේශීය වියදම.(GDE)**

| | රු.මිලියන |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | 2,000 |
| රජයේ පරිභෝජන වියදම | 1,500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | <u>1,200</u> |
| **වෙළෙඳපොළමිලට දළ දේශීය වියදම.(GDE)** | **<u>4,700</u>** |

***(ලකුණු 04)***

**(b) වෙළෙඳපොළමිලට දළ දේශීය නිෂ්පාදිතය. (GDP)**

| | |
|---|---|
| වෙළෙඳපොළමිලට දළ දේශීය වියදම.(GDE) | **4,700** |
| +භාණ්ඩ හා සේවා අපනයන | 1,800 |
| -භාණ්ඩ හා සේවා ආනයන | <u>(1,250)</u> |
| **වෙළෙඳපොළමිලට දළ දේශීය නිෂ්පාදිතය.(GDP)** | **<u>5,250</u>** |

***(ලකුණු 03)***

**(c) වෙළෙඳපොළමිලට දළ ජාතික ආදායම (GNI)**

| | |
|---|---|
| **වෙළෙඳපොළමිලට දළ දේශීය නිෂ්පාදිතය. (GDP)** | 5,250 |
| (-) විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | <u>(800)</u> |
| **වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම(GNI)** | **<u>4,450</u>** |

***(ලකුණු 03)***
***(මුළු ලකුණු 20)***

**C කොටසෙහි අවසානය**

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2020 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*